# වනයෙන් මැදුරට ආ සල්ලි මල

මලත් ළඳත් අතර අතීතයේ සිටම ඇත්තේ ඉතා සමීප සම්බන්ධතාවකි. එහෙත් මෑතක් වනතෙක්ම බොහෝ කාන්තාවන් මල් වගාව කරන ලද්දේ සිය නිවසේ හා ගෙවත්තේ අලංකාරය සඳහායි. ක්‍රමයෙන් ලෝකය දියුණු වී මිනිස් අවශ්‍යතා සංකීර්ණ වී බොහෝ කටයුතු සඳහා මුදල් ආරෝපණය වීමත් සමඟ, මෙතෙක් අලංකාරය සඳහා පමණක් වැදගත් වූ මල් සඳහා ද මූල්‍ය අගයයන් ලැබී ඇත. මෙම මල් අතුරින් ඕකිඩ් මලට ලැබෙනුයේ සුවිශේෂ ස්ථානයකි.

එකඩායියේ කුලයට අයත් ඕකිඩ් මල් විශාල ප්‍රභේද සංඛ්‍යාවක් ඇති අතර, ලෝකයේ විවිධ දේශගුණ තත්ත්වයන් යටතේ ඒවා වැඩේ. ලංකාව සම්බන්ධයෙන් සලකා බලන විට මිලි මීටර් 75 - 150 අතර වාර්ෂික වර්ෂාපතනයක් සහිත මුහුදු මට්ටමේ සිට අඩි 2000 - 4000 අතර පහතරට හා මැදරට ප්‍රදේශවල ඕකිඩ් ශාකය ඉතා හොඳින් වැඩේ. මෑතක් වනතුරු ඕකිඩ් ශාකය ව්‍යාප්තව පැවතියේ ධනවත් නාගරික මිනිසුන්ගේ ගෙවතු වගාවන් ලෙසටයි. එහෙත් 1968 දී "ලක්මල්සල" පිහිටුවීමත්, ගුවන් ගමන් සේවා දියුණුවීමත්, දෙස් විදෙස් ආයෝජන රට තුළට ගලා ඒමත් සමඟ ඕකිඩ් මල් සඳහා ඉල්ලුමක් ඇතිවිය. අවසානයේ නගරයේ ධනවතුන්ට පමණක් සීමා වූ ඕකිඩ් මල ක්‍රමයෙන් ගම්දනව් කරාද සංක්‍රමණය විය. සුලු ව්‍යාපාරයක් වශයෙන් ඕකිඩ් වගා කිරීමේදී සාමාන්‍යයෙන් බඳුන් 500 ක ඕකිඩ් පාත්තියකින් අවුරුදු එක හමාරකට පමණ පසු සති 2කට වරක් රු.2000 - 4000ක් අතර ආදායමක් ලබාගත හැකිවේ. වෙළෙඳපොළේ ඕකිඩ් මලක් සාමාන්‍යයෙන් රු.2 - 3 ක් අතර මිලකට අලෙවි කළ හැක. මේ නිසා අද බොහෝ ගම්වල තරුණ තරුණියෝ ස්වයං රැකියාවක් ලෙස ඕකිඩ් වගාව කරගෙන යති.

ඩෙන්ඩ්‍රෝබියම්, වැන්ඩා, එක්සීඩියම්, ඇරැන්ඩා, පැලනොක්සිම්, අරැන්තරා, මැකාති වැනි ඕකිඩ් ප්‍රභේද විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව පැවතියත් වඩා බහුල ලෙස වගා කරන්නේත්, ඉල්ලුමක් පවතිනුයේත් ඩෙන්ඩ්‍රෝබියම් සඳහායි.

සාමාන්‍යයෙන් ඩෙන්ඩ්‍රෝබියම් වගා කිරීම සඳහා පහත සඳහන් තත්ත්වයන් පැවතිය යුතුය.

| | |
|---|---|
| ආර්ද්‍රතාවය (වායුගෝලයේ | |
| තෙතමනය | 75% |
| උෂ්ණත්වය | 80% |
| ආලෝකය | 50% |

ආලෝකය අඩුකර ගැනීම සඳහා ලනු දැල් හෝ කෘතිම දැල් භාවිතා කළ හැක. බීජ මගින් හෝ පත්‍ර මගින් ජනිතකර ගත් කුඩා ඕකිඩ් පැළ අඟල් 2ක් පමණ වන විට කුඩා ප්ලාස්ටික් බඳුන්වල කඩන ලද අඟුරු කැබලි දමා සිටුවන්න. මෙසේ පැළ කරන ලද පැළ බඳුන් පොළොවට අඩි දෙක හමාරක් පමණ උසින් කොන්ක්‍රීට් රීප්ප මත හෝ ඝනකම් යකඩ දැලක් මත හෝ තැබිය යුතුය. සාමාන්‍යයෙන් මෙවැනි පැළ 500ක් තැන්පත් කිරීම සඳහා වර්ග අඩි 40ක පමණ ඉඩ ප්‍රමාණයක් අවශ්‍යය. සාමාන්‍ය ඕකිඩ් වගාව සඳහා මල් ඒමට ප්‍රථමයෙන් පොහොර හා කෘමි නාශක වැනි දෑ නිරන්තරයෙන් යෙදිය යුතුය.

20 : 30 - 20 ශුල්ස්
30 : 10 : 10 පීටර්ස්
18 : 18 : 18 නියුට්‍රොපෝල්

(ක්‍රොප්මාස්ටර්, කැප්ටාන් වැනි දෑ එහි අඩංගු උපදෙස් මත භාවිතා කළ හැකිය.) සෑම දිනයකම දිනකට දෙවරක්වත් ජලය යෙදිය යුතුය. මල් කැපීම සඳහා කිතිත්තක මල් දෙකක් තුනක්වත් අඩුම තරමින් පිපිය යුතුය. මල් කැපූ විගසම එය ජල බඳුනක බහාලිය යුතුය.

දේශීය වශයෙන් ලංකාවේ ප්‍රධාන වෙළෙඳපොළවල් දෙකක් ඕකිඩ් මල් සඳහා පවතී. ඔබට සතියකට වරක් ඕකිඩ් මල් 350 ක් තරම්වත් සැපයිය හැකි නම් ලක්මල්සලෙහි සාමාජිකත්වය ලබාගෙන අඛණ්ඩව මල් සැපයීම තුළින් වැඩි ආදායමක් ඉපයිය හැකිවේ. සංචාරක කර්මාන්තය ව්‍යාප්ත වූ ප්‍රදේශවල හා සංචාරක හෝටල් වලද ඕකිඩ් මල් සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර සාමාන්‍ය මිළට වඩා ඉහළ මිළකට අලෙවි කළ හැකිවේ. මේවාට අමතරව මංගල්‍ය, අවමංගල්‍ය, පිළිගැනීම් උත්සව ආදී නොයෙකුත් කටයුතු සඳහා ඕකිඩ්වලට ඉතා හොඳ ඉල්ලුමක් ඇත.

අනාගතයේදී ඕකිඩ් මල් විදේශ වෙළඳපොළට යැවීමට අවශ්‍ය කටයුතු මේ දිනවල විවිධ පුද්ගලයින් හා ආයතන විසින් ලහිලහියේ සූදානම් වේ. එය සපල වුවහොත් ඕකිඩ් මල් සඳහා පවතින ඉල්ලුම අදට වඩා සිය දහස් ගුණයකින් ඉහළ යනු ඇත. එහෙත් පවතින තත්ත්වය වනුයේ දේශීය ඉල්ලුම සපුරාලීමට තරම්වත් ඕකිඩ් එලදාවක් අද ලංකාව සතුව නොමැතිවීමයි. එහෙයින් ඔබට නිවසේ සිටම ගෙදර දොර ආදායමක් ලෙසත් ස්වයං රැකියාවක් ලෙසත් ඕකිඩ් වගාව ආරම්භ කළ හැකියි.